# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

09 ශ්‍රේණිය | ඉතිහාසය | ඒකකය 06 -නිදහසින් පසු ශ්‍රී ලංකාව

## I කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මහ මැතිවරණයක් පැවැත්වූයේ,
    (1). 1950 දීය (2). 1948 දීය (3). 1952 දීය (4). 1956 දීය

02. ඩී.එස්. සේනානායක මහතාගේ අභාවයෙන් පසු අගමැති තනතුරට පත් වූයේ,
    (1). සර් ජෝන් කොතලාවල මහතා
    (2). ඩඩ්ලි සේනානායක මහතා
    (3). එෆ්.ආර්. සේනානායක මහතා
    (4). එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

03. 1956 මහ මැතිවරණයට අනුව ජයග්‍රහණය කළ දේශපාලන පක්ෂය වූයේ,
    (1). මහජන එක්සත් පෙරමුණ
    (2). එක්සත් ජාතික පක්ෂය
    (3). ලංකා සම සමාජ පක්ෂය
    (4). ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

04. 1959 වර්ෂයේ දී සාහසිකයෙකුගේ වෙඩි පහරින් ඝාතනය වූ දේශපාලන නායකයා වූයේ,
    (1). සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය
    (2). එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
    (3). සර් ජෝන් කොතලාවල මහතා
    (4). ඩී.එස්. සේනානායක මහතා

05. 1960 ජූලි මැතිවරණ ප්‍රතිඵල අනුව මෙරට අගමැති තනතුරට පත්වූයේ
    (1). සර් ජෝන් කොතලාවල මහතා
    (2). විජයානන්ද දහනායක මහතා
    (3). සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය
    (4). ජේ.ආර්. ජයවර්ධන මහතා

06. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සම සමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය සමඟ එක්ව සංවිධානය වී ගොඩනැගූ පෙරමුණ වූයේ,
    (1). එක්සත් ජාතික පක්ෂය
    (2). සමගි පෙරමුණ
    (3). ජනතා විමුක්ති පෙරමුණ
    (4). සමගි ජන බලවේගය

07. 1960 ජූලි මැතිවරණයෙන් පිහිට වූ ආණ්ඩුවේ වැඩපිළිවෙලක් නොවන්නේ,
    (1). සියලු පාසල් රජයට පවරා ගැනීම
    (2). දේශීය ආර්ථිකය නගාසිටුවීම වෙනුවෙන් 1961 දී මහජන බැංකුව පිහිටුවීම
    (3). මේ තුළින් ගොවි ජනතාවට ගොවිතැන් කටයුතු සඳහා ණය මුදල් ලබා දීම
    (4). සහල් ඇතුලු ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ දැමීම

08. බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වාදෙනු ලැබූ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ කාලවකවානුව වූයේ,
    (1). 1948-1972 (2). 1947-1972 (3). 1948-1956 (4). 1947-1960

09. ශ්‍රී ලංකාවේ පූර්ණ නිදහසට තිබූ බාධා ඉවත් කොට ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වූයේ,

(1). 1948 පෙබරවාරි 04 දින ය (3). 1972 මැයි 22 දින ය

(2). 1965 ජූලි 22 දින ය (4). 1972 පෙබරවාරි 04 දින ය

10. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනතාවගේ නායකයා වූයේ,

(1). අගමැතිවරයා ය (3). ජනාධිපතිවරයා ය

(2). අග්‍රාණ්ඩුකාරවරයා ය (4). බ්‍රිතාන්‍ය මහ රැජින ය

- **පහත දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11. මෙර ටමහ මැතිවරණ ඉතිහාසයේ 1960 මාර්තු සහ 1960 ජූලි වශයෙන් මහ මැතිවරණ 2ක් පැවැත්විණි. ( )
12. මෙරට ප්‍රථම නාමික විධායක ජනාධිපති ධූරය දැරුවේ සර් ජෝන් කොතලාවල මහතාය. ( )
13. 1972 ව්‍යවස්ථාව යටතේ මෙරට අභියාචනා නඩු විසඳීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා තිබුණි. ( )
14. 1931-1947 කාලයේ මෙරට කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කළේ ඩඩ්ලි සේනානායක මහතාය. ( )
15. දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ලෙස හැඳින්වේ. එනම් ඒකීය රාජ්‍යයකි. ( )

- **හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. ඩී.එස්. සේනානායක මහතා 1946 එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමේ පුරෝගාමියා මෙන්ම ශ්‍රී ලංකාවේ (ප්‍රථම අගමැති / ප්‍රථම ජනාධිපති) ......................... වේ.
17. ලොව ප්‍රථම අගමැතිනිය වීමේ භාග්‍යය හිමි වුයේ ................................ (ඩී.එස්. සේනානායක මහතා / සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය) ටය.
18. ලංකාව ''ශ්‍රී ලංකාව'' ලෙස හැඳින්වූයේ ............................. (1972 ව්‍යවස්ථාව / 1978 ව්‍යවස්ථාව) තුළිනි.
19. ලංකාවේ ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය ලෙස සැලකෙනුයේ ........................ (ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය / මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය) වේ.
20. 1959 දී ප්‍රථම කාර්මික ජනපදය පිහිටුවීම ............................. (ඒකල / රත්මලාන) ප්‍රදේශයේ සිදු විය.


## II කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පහත පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B

(1). ඉහත A රූපයෙන් දැක්වෙන්නේ කවුද?

(2). එතුමිය මෙරට අගමැති ධුරයට පත් වූ පසු නව ව්‍යවස්ථාවක් සම්මත කරන ලදි. එය හැඳින්වෙන නම හා සම්මත කළ දිනය දක්වන්න.

(3). B රූපයෙන් දැක්වෙන්නේ කවුද?

(4). එතුමා නායකත්වය දැරූ දේශපාලන පක්ෂය නම් කරන්න.

(5). එතුමා මෙරට විධායක ජනාධිපති වූයේ කිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේද?

02. (1). 1952 මහ මැතිවරණයෙන් බහුතර ආසන සංඛ්‍යාවක් දිනාගත් දේශපාලන පක්ෂය කුමක්ද? ආණ්ඩුව පිහිටවූ අගමැති වූයේ කවුද? (ල.03)

(2). 1952-1956 කාලයේ මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ කැපීපෙනෙන ලක්ෂණ 4ක් නම් කරන්න. (ල.04)

(3). 1956 මහ මැතිවරණයෙන් ජයගත්,

(a) දේශපාලන පක්ෂය කුමක්ද?

(b) අගමැති තනතුරට පත්වූයේ කවුද? (ල.04)

(4). 1956 මැතිවරණයෙන් පිහිටවූ ආණ්ඩුවේ වැඩපිළිවෙල කරුණු 3 දක්වන්න. (ල.03)

03. (1). 1960 වර්ෂයේ මැතිවරණ 2ක් පැවැත්වීමට සිදුවූයේ ඇයි? (ල.04)

(2). 1960 මැතිවරණයෙන් අගමැති තනතුරට පත් වූයේ කවුරුන්ද? (ල.03)

(3). සියලු පාසල් රජයට පවරා ගැනීම සිදුවූයේ කුමන වර්ෂයේද? බලපෑ හේතුව කුමක්ද? (ල.04)

(4). එසේ පිහිටුවාගත් ආණ්ඩුව නියමිත කාලයට පෙර විසුරුවාහැරීමට සිදුවූ හේතු 2ක් දක්වන්න. (ල.04)

04. (1). 1947 සිට 1972 දක්වා ශ්‍රී ලංකාවේ,

(a) අගමැතිවරු කීදෙනෙකු සිටියේද? (ල.02)

(b) වර්ෂයද සමඟ ඔවුන් නම් කරන්න. (ල.06)

(2). 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ 4 දක්වන්න. (ල.04)

(3). එම අංග ලක්ෂණවලින් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල.03)

05. (1). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග 5 දක්වන්න. (ල.05)

(2). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට හිමිවී ඇති පාර්ලිමේන්තුව සම්බන්ධ බලතල මොනවාද? (ල.03)

(3). 1978 ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට හිමි වී ඇති බලතල 5 ක් දක්වන්න. (ල.05)

(4). 1978 ව්‍යවස්ථාව අනුව රාජ්‍ය නායකයා වශයෙන් ජනාධිපතිවරයාට පැවරී ඇති කාර්යයන් මොනවාද? (ල.02)

06. (1). නිදහසින් පසු බලයට පත්වූ මෙරට රජයන් විසින් වී ගොවිතැන දියුණු කිරීම පිණිස ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති 3ක් දක්වන්න. (ල.03)

(2). වියලි කලාපයට ජනතාව රැගෙන ගොස් ගොවිජනපද ආරම්භ කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු 4ක් දක්වන්න. (ල.04)

(3). මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය අරමුණු 4ක් දක්වන්න. (ල.04)

(4). නිදහසින් පසු අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව පිණිස රජය විසින් ගන්නා ලද පියවර 4ක් දක්වන්න. (ල.04)

*සැකසුම: පමෝදා හේවාවිතාරණ මිය*